# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2484/08 - 2026 අප්‍රේල් මස 17 වැනි සිකුරාදා - 2026.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය: පීඑස්/සීඑස්ඒ/00/06/20/02

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති**
**අනුර කුමාර දිසානායක මැතිතුමන් විසිනි.**

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

1. **ගරු කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා**
   **ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර**
2. **ගරු ආදිත්‍ය කාන්ත මද්දුම පටබැඳිගේ මැතිතුමා**
   **අභියාචනාධිකරණ විනිශ්චයකාර**
3. **හේවාසිංහගේ සංජීව සෝමරත්න මැතිතුමා**
   **මහාධිකරණ විනිශ්චයකාර**

වෙත,

සුභාශිංසන පූර්වකවයි!

ශ්‍රී ලංකාව තුළ ගල් අඟුරු ආශ්‍රිතව විදුලි ජනන ක්‍රියාදාමය ආරම්භ වූ අවස්ථාවේ සිට 2026 අප්‍රේල් මස 16 වන දිනෙන් අවසන් වූ කාලසීමාව තුළ රජයට අයත් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ/හෝ එහි අනුප්‍රාප්තිකයන් මඟින් ශ්‍රී ලංකාවට ගල් අඟුරු ආනයනය කිරීම සඳහා සිදු කරන ලද සියලුම ප්‍රසම්පාදන ක්‍රියාවලියන් පිළිබඳවත්, ගල් අඟුරු භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය පිළිබඳවත්, සහ ඊට ආනුෂංගික සියලු ක්‍රියාදාමයන්හිදී සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ නිලධාරින්/සේවකයින් මඟින් සහ/හෝ රජයේ නිලධාරින් මඟින් සහ/හෝ දේශපාලඥයින් මඟින් සහ/හෝ සැපයුම්කරුවන් මඟින් සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් මඟින් සහ/හෝ ඔවුන්ගේ ඍජු හෝ වක්‍ර මැදිහත් වීම මඟින් විවිධ අකටයුතුකම් සහ/හෝ නීති විරෝධී ක්‍රියා සිදු වී ඇති බවට මහජනතාව තුළ මතයක් ගොඩනැගී ඇති හෙයින් ද,


1A - G 046630 — 353 (2026/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උක්ත සඳහන් කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවට ගල් අඟුරු ආනයනය සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය, එම ක්‍රියාවලිය තුළ පැවතිය යුතු සුපරීක්ෂාකාරීත්වය, ප්‍රමිතිකරණ මට්ටම පරීක්ෂාව, පෙර හා පසු විපරම් ක්‍රියාපටිපාටිය පිළිබඳව විවිධ චෝදනා එල්ල වන හෙයින් ද,

ගල් අඟුරු ප්‍රසම්පාදනය කර ආනයනය සිදු කිරීමේදී එකී ගල් අඟුරු නිසි ප්‍රමිති මට්ටමට නොතිබීම හේතුවෙන් ගල් අඟුරු මඟින් සිදු කරනු ලබන විදුලි ජනන ක්‍රියාදාමය අපේක්ෂිත මට්ටමට සිදු නොවූ බවට චෝදනා එල්ලවන හෙයින් ද,

ඉහත කී ගල් අඟුරු මඟින් විදුලි බල උත්පාදන ක්‍රියාවලිය තුළ දී නෛතික හා මූල්‍යමය අක්‍රමිකතා සහ/හෝ නීති විරෝධී ක්‍රියා සිදු වී ඇති බවට චෝදනා එල්ලවන හෙයින් ඒ සඳහා වගකිව යුතු දේශපාලන අධිකාරිය, රජයේ නිලධරයින් හා සැපයුම්කරුවන් සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් හඳුනාගෙන ඔවුන්ගේ වගවීම හා වගකීමේ වපසරිය වාර්තා කිරීම සඳහා ද,

එසේ සඳහන් කරනු ලබන යම් අක්‍රමිකතා/නීති විරෝධී ක්‍රියා සිදු වී ඇත්නම් අනාගතයේදී එවැනි සිදුවීම් වලක්වා නිසි සුපිලිපන්නභාවය තහවුරු කිරීම සඳහා ගත යුතු ඉදිරි පියවරයන් දැන ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් ද,

මාගේ අදහස අනුව මහජන සුභසිද්ධිය උදෙසා මතු සඳහන් කරන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවීමට අවශ්‍යවන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර පූර්වෝක්ත ඔබතුමන්ලා එනම්,

1. **ගරු කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා**
   **ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර**
2. **ගරු ආදිත්‍ය කාන්ත මද්දුම පටබැඳිගේ මැතිතුමා**
   **අභියාචනාධිකරණ විනිශ්චයකාර**
3. **හේවාසිංහගේ සංජීව සෝමරත්න මැතිතුමා**
   **මහාධිකරණ විනිශ්චයකාර**

මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා එනම්,

1. ශ්‍රී ලංකාව තුළ ගල් අඟුරු ආශ්‍රිතව විදුලි ජනන ක්‍රියාදාමය ආරම්භ වූ අවස්ථාවේ සිට 2026 අප්‍රේල් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවට ගල් අඟුරු ආනයනය කිරීම සඳහා සිදුකරන ලද සියලුම ප්‍රසම්පාදන ක්‍රියාවලියන් තුළ අක්‍රමිකතා/නීති විරෝධී ක්‍රියා සිදු වී ඇත්ද, නැද්ද යන වග හා එමඟින් රජයට මූල්‍යමය හානියක් සිදු වී ඇත්නම් එය තක්සේරු කිරීම,

2. උක්ත කාලය තුළ දී නිසි ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු ආනයනය කර ඇත්ද, නැද්ද යන වග සහ මීට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාදාමය, සැපයීම් ක්‍රියාදාමය, තත්ත්ව පරීක්ෂණ ක්‍රියාදාමය, සුපරීක්ෂණ ක්‍රියාදාමය, මෙහෙයුම් ක්‍රියාදාමය සහ උපයෝගිතා ක්‍රියාදාමය ඇතුළු සමස්ථ සම්බන්ධිත ක්‍රියාදාමයන් විමර්ශණයට ලක් කිරීම,

3. ඉහත කී පරිදි ආනයනය කරන ලද ගල් අඟුරු භාවිතයෙන් විදුලි ජනන ක්‍රියාදාමය සිදු කිරීමේදී, විදුලි ජනන මට්ටම අපේක්ෂිත ඵලදායී ආකාරයට සිදු වී ඇත්ද, නැද්ද යන වග,

4. එකී ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු ආනයනය කරන ලද්දේ නම්, එම ගල් අඟුරු භාවිතා කර විදුලි බල උත්පාදන ක්‍රියාවලිය තුළ දී නෛතික හා මූල්‍යමය අක්‍රමිකතා/නීති විරෝධී ක්‍රියා සිදු වී ඇත්ද, නැද්ද යන වග,

5. මෙකී ක්‍රියාදාමය තුළ සිදුකර ඇති ප්‍රකාශිත සහ/හෝ ව්‍යාංග කොන්දේසි කඩකිරීම් සිදු වී ඇත්ද, නැද්ද යන වග සහ එලෙස සිදු වී ඇත්නම් එකී කඩවීම්වලට එරෙහිව ගෙවීම් අත්හිටුවීමට සහ/හෝ වෙනත් හානි පූර්ණ ක්‍රියාදාමයන් අනුගමනය කර ඇද්ද, නැද්ද යන වග,

6. ඉහත 1,2,3,4 හා 5 යන ආකාරයේ සිදුවීම් සිදු වී ඇත්නම් ඒ සඳහා වගකිව යුතු දේශපාලන අධිකාරිය, රජයේ නිලධාරින්, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ නිලධාරින්/සේවකයින් හා සැපයුම්කරුවන් සහ/හෝ ඔවුන්ගේ නියෝජිතයින් හඳුනාගෙන ඔවුන් සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග,

7. එසේ සිදුවී යයි කියනු ලබන අකටයුතුකම් හෝ නීතිවිරෝධී ක්‍රියා අනාගතයේදී සිදුවීම වලක්වා නිසි සුපිලිපන්නභාවය තහවුරු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග,

8. ඉහත සඳහන් කරුණුවලට අමතරව ගල් අඟුරු ආනයනය කර විදුලි උත්පාදනය සම්බන්ධයෙන් සිදු වී ඇතැයි වාර්තා විය හැකි වෙනත් අකටයුතුකම් හෝ නීතිවිරෝධී ක්‍රියා සම්බන්ධව වාර්තා කිරීම හා එවැනි තත්ත්වයන් ඇති වීම වැළැක්වීමට ගතයුතු ක්‍රියාමාර්ග,

විමර්ශනය කර වාර්තා කිරීම පිණිස ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වැනි ව්‍යවස්ථාව සහ 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එම වාර්තාව අනුව යම් තැනැත්තෙකු ප්‍රජා අශක්නුතාවකට යටත් කළ යුතු වේ ද යන්න නිර්දේශ කිරීම පිණිස ද මාගේ කොමසාරිස්වරයන් වශයෙන් මෙයින් පත් කරමි.

තවද, පූර්වෝක්ත විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති වශයෙන් **ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්වයකාර ගරු කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා** වන ඔබ මෙයින් පත් කරමි.

තවද, උක්ත සඳහන් කරුණු විමර්ශනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය යැයි ඔබට පෙනී යා හැකි සියලුම පරීක්ෂණ පැවැත්වීමටත්, සෙසු සියලුම විමර්ශනයන් සිදු කිරීමටත්, ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් බලය හා අධිකාරය පවරන අතර, මේ අධිකාර පත්‍රයෙහි දින සිට මාස 06ක කාලයක් තුළ අවශ්‍ය පරීක්ෂණ සහ විමර්ශන සිදු කර ඔබතුමන්ලාගේ නිගමනයන් සහ නිර්දේශ, පනවන (පැනවීමට නිර්දේශ කරනු ලබන) දඬුවම් ද ගෙනහැර දක්වමින් අවසන් වාර්තාව සහ/හෝ අතුරු වාර්තා ඔබතුමන්ලාගේ අත්සනින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණයන්ට අදාළ කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබතුමන්ලාගේ අභිමතය පරිදි නිශ්වය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පරීක්ෂණයන්හි හෝ විමර්ශනයන්හි කාර්යයන් සඳහා ඔබතුමන්ලා විසින් අවශ්‍යය යයි සලකනු ලැබිය හැකි විශේෂඥ/ තාක්ෂණික සහාය ඕනෑම රාජ්‍ය සහ/හෝ රාජ්‍ය නොවන ආයතන සහ/හෝ පුද්ගලයන්ගෙන් ලබා ගැනීමේ බලය මෙයින් පවරනු ලැබේ. එවැනි සහාය ඉල්ලා සිටිනු ලැබිය හැකි සියලුම රාජ්‍ය සහ/හෝ රාජ්‍ය නොවන ආයතන සහ/හෝ පුද්ගලයන්ගෙන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන එකී පනතේ 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවට අදාළ විය යුතු බවට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිහයක් වූ අප්‍රේල් මස 17 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ආචාර්ය එන්.එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

EOG 04-0089

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.